# පුරප්පාඩු
# ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය - ශ්‍රී ලංකාව

අනධ්‍යයන කාර්ය මණ්ඩල පුරප්පාඩු පිරවීම සඳහා අයදුම්පත් කැඳවීම
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා පමණි)

මෙම විශ්වවිද්‍යාලයේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුරු සඳහා අවශ්‍ය සුදුසුකම් ඇති විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ, විශ්වවිද්‍යාලවල හා ඊට අනුබද්ධ උසස් අධ්‍යාපන ආයතනයන්හි තනතුරේ තහවුරු කරන ලද **ස්ථිර සේවක භවතුන්ගෙන්** පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්පත් මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ පමණක් ඉදිරිපත් කළ යුතු අතර අයදුම්පත් ඉදිරිපත් කිරීම සඳහා https://gwu.ac.lk/ මාර්ගගත ද්වාරය (Online portal) **2025.11.12** දින **2025.12.12** දින **දක්වා** විවෘතව පවතිනු ඇත. වැඩි විස්තර https://gwu.ac.lk/ වෙබ් පිටුව මගින් ලබා ගත හැකි අතර මාර්ගගත ක්‍රමවේදය ඔස්සේ අයදුම්පත් ඉදිරිපත් කිරීම සහ අයදුම් කිරීමේ උපදෙස් ලබා ගැනීම සඳහා https://gwu.ac.lk/ වෙත පිවිසිය යුතුය.

මාර්ග ගත ක්‍රමවේදය ඔස්සේ **සම්පූර්ණ කරන ලද අයදුම්පතෙහි දෘඪ පිටපතක්** තමා සේවය කරන ආයතනයේ ලේකම්/ ලේඛකාධිකාරි/ මණ්ඩපාධිපති/ අධ්‍යක්ෂ මගින් **2025.12.12** වන දින **හෝ එදිනට ප්‍රථම** ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් **සහකාර ලේඛකාධිකාරි, ආයතන අනධ්‍යන අංශය, ගම්පහ වික්‍රමාරච්චි දේශීය වෛද්‍ය විශ්වවිද්‍යාලය, නුවර පාර, යක්කල** යන ලිපිනයට එවීමට පියවර ගත යුතුය. අයදුම්පත්‍රය බහාලන ලිපි කවරයේ ඉහළ වම් කෙළවරේ අදාල තනතුර සඳහන් කිරීම අත්‍යාවශ්‍ය වේ.

අවශ්‍ය විස්තර සඳහන් නොකිරීම, අපැහැදිලිවීම, සුදුසුකම් සනාථ කිරීමට අදාළ සහතිකවල සහතික කරන ලද ඡායා පිටපත් අමුණා නොතිබීම සහ අයදුම්පත් නියමිත දිනට පසුව ලැබීම හෝ වෙනයම් අවශ්‍යතාවයක් සපුරා නොතිබීම අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීමට හේතුවේ. කිසියම් අයදුම්පත්‍රයක් ප්‍රතික්ෂේප කළවිට කුමන හේතුවක් නිසා හෝ යලි සලකා බලනු නොලැබේ.

විමසීම් සඳහා රාජකාරි දිනවල පෙ.ව. 9.00 සිට ප.ව. 4.00 දක්වා 033 2215829 දුරකතන අංකය ඔස්සේ ඇමතිය හැකිය.

## 1. ඖෂධවේදී (පහළ ශ්‍රේණිය)

**අවශ්‍ය සුදුසුකම් :** සුදුසුකම්ලත් ඖෂධවේදියෙකු වශයෙන් ශ්‍රී ලංකා වෛද්‍ය සභාවෙන් පිළිගනු ලබන සහතිකයක් ලබා තිබීම.

**වැටුප් පරිමාණය :U-MT 1 (III) - රු.51,095-7X540;10X640-60,575 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** සම්මුඛ පරීක්ෂණයක් මගින්

## 2. තාක්ෂණික නිලධාරි II ශ්‍රේණිය "ආ" ඛණ්ඩය

**අවශ්‍ය සුදුසුකම් :** (a) අ.පො.ස.(සා/පෙළ) විභාගයෙන් දෙවතාවකට නොවැඩි වාර ගණනකදී සම්මාන සමාර්ථ 05 ක් සහිතව විෂයයන් 06 කින් සමත් වී තිබීම. සම්මාන සාමාර්ථ ලබාගත් විෂයයන් අතරට විද්‍යාව හා ගණිතය යන විෂයයන් ඇතුළත් විය යුතුය.

හෝ

(b) තෙවරකට නොවැඩි වාර ගණනකදී අ.පො. ස (සා.පෙළ) විභාගයෙන් විද්‍යාව හා ගණිතය යන විෂයයන් ඇතුළුව විෂයයන් 06 කින් සමත් වී තිබීම සහ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ හෝ උසස් අධ්‍යාපන ආයතනයක වසර 08 ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් තිබීම.

හෝ

(c) උසස් අධ්‍යාපන ආයතනයක විද්‍යාගාර සහායකයකු වශයෙන් වසර 15ක සතුටුදායක ස්ථිර සේවා කාලයක් සපුරා තිබීම.

**සටහන:-** බඳවාගනු ලබන තැනැත්තන් ප්‍රථමයෙන් අවුරුදු (03) ක පුහුණුවීමේ කාලසීමාවකට යටත්ව "පුහුණුවන තාක්ෂණික නිලධාරී" වශයෙන් පත් කරනු ලැබේ. පුහුණුවීමේ කාලය අවසන් වීමෙන් පසු විද්‍යාගාර කටයුතු පිළිබඳ නිපුණත්වය, භාණ්ඩ ඇණවුම් කිරීම, තොග පොත් පවත්වාගෙන යාම සහ ඉංග්‍රිසි භාෂාවෙන් යතුරු ලිවීම පිළිබඳ ප්‍රවීණත්වයක් ලබා ගත් සේවක හවතුන් තනතුරෙහි තහවුරු කර II ශ්‍රේණිය "ආ" ඛණ්ඩයේ තාක්ෂණික නිලධාරි තනතුරට පත් කරනු ලැබේ.

**වැටුප් පරිමාණය : UMT 1 (III) - රු.51,095-7X540;10X640-60,575 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** යෝග්‍යයතා පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

## 3. තාක්ෂණික නිලධාරි II ශ්‍රේණිය "අ" ඛණ්ඩය

**අවශ්‍ය සුදුසුකම් :**

i. ජාතික තාක්ෂණ ඩිප්ලෝමා සහතිකය (NDT) හෝ ඒ සමාන සුදුසුකම් ලබා තිබීම.

හෝ

ii. ඉංජිනේරු උසස් ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

හෝ

iii. අදාළ විෂය ක්ෂේත්‍රය පිළිබඳ වන ජාතික ඩිප්ලෝමාව ලබා තිබීම.

iv. අදාළ විෂය ක්ෂේත්‍රයට අදාළව වසර දෙකක පූර්ණකාලීන ඩිප්ලෝමාව සමඟ අදාළ ක්ෂේත්‍රයේ වසරක පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය :UMT 1 (II) - රු.57,435-7X640;9X890-69,925 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.
වෛද්‍ය රසායනාගාර තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය (වෙබ් අඩවි සංවර්ධනය, පවත්වා ගෙන යාම, දත්ත කළමනාකරණය සහ වැඩසටහන්කරණය අතුළුව)/ ජීව විද්‍යාව, විද්‍යාව, ජෛව තාක්ෂණය, රසායන විද්‍යාව/ බහුමාධ්‍ය හෝ ශ්‍රව්‍ය දෘශ්‍ය ශිල්පීය ක්‍රම, රසායන හා ක්‍රියාවලී තාක්ෂණ ක්ෂේත්‍රයන්හි මනා දැනුමක් හා අත්දැකීමක් ඇති අයට ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

**4. <u>තාක්ෂණික නිලධාරි (තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය) III ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම් :** (a) අ.පො.ස.(උ/පෙළ) විභාගයේ ඕනෑම විෂය ධාරාවක් යටතේ එක් වරකදී විෂයයන් තුනක් (03) සමත්වී තිබියයුතුය.

සහ

(b) තොරතුරු සන්නිවේදන හා බහු මාධ්‍ය තාක්ෂණය/ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය/ තොරතුරු තාක්ෂණය ක්ෂේත්‍රයේ හෝ ඊට සමාන ක්ෂේත්‍රයක තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන කාර්මික/ වෘත්තීය පුහුණු ආයතනයකින් හෝ පිළිගත් ආයතනයකින් නිකුත් කරන ලද ජාතික වෘත්තීය සුදුසුකමේ 5 වන මට්ටම (N.V.Q. Level 5) හෝ ඊට නොඅඩු මට්ටමක ප්‍රවීනතා සහතිකයක් ලබා තිබීම.

- තොරතුරු සන්නිවේදන තාක්ෂණය පිළිබඳ සේවා පළපුරුද්ද ඇති අයදුම්කරුවන් කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.

**වැටුප් පරිමාණය :UMT 1 (III) - රු.51,095-7X540;10X640-60,575 (මාසික)**

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** ලිඛිත හා / හෝ ප්‍රායෝගික පරීක්ෂණයක් හා සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**5. <u>කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) III ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම් :** 1. අ.පො.ස.(සා/පෙළ) විභාගය පහත සඳහන් විෂයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත්වී තිබීම.

(i) සිංහල භාෂාව / දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
(iii) ගණිතය

සහ

2. අ.පො.ස.(උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

(a) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ

(b) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) ක පළපුරුද්දක් තිබීම.

**<u>තනතුරට විශේෂ වූ සුදුසුකම්</u>**

ඉහතින් දක්වා ඇති සුදුසුකම් වලට අමතරව අයදුම්කරුවන් කළමනාකරණ සහකාර (ගබඩා භාරකරු) තනතුරට විශේෂ වූ පහත සුදුසුකම් සපුරාලිය යුතුය.

ගබඩාකරණය පිළිබඳ අවම වශයෙන් වසරක පළපුරුද්ද සහ/හෝ අ.පො.ස.(සා.පෙළ) විභාගයේදී වාණිජ්‍ය විෂය සමත්ව තිබීම හෝ අ.පො.ස.(උ.පෙළ) විභාගයේදී ගිණුම්කරණය විෂය සමත්ව තිබීම.

<u>සටහන</u>:- විශ්වවිද්‍යාලය විසින් තීරණය කරනු ලබන පරිදි තෝරාගනු ලබන අයදුම්කරුවන් විසින් ආරක්ෂක තැන්පතුවක් (Security Deposit) තැබිය යුතුය.

වැටුප් පරිමාණය :**UMN 1 (III) - රු. 49,475 – 17x540 – 58,655 (මාසික)**

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (ලකුණු 25%) මඟින්

ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයන්ගෙන් සමන්විතය

- Knowledge in Sinhala/ Tamil & English Language
- Intelligent Quotient and General knowledge
- Computer Literacy
- Relevant Subject area

## 6. කළමනාකරණ සහකාර (පොත් තබන්නා) III ශ්‍රේණිය

**අවශ්‍ය සුදුසුකම් :** 1. අ.පො.ස.(සා/පෙළ) විභාගය පහත සඳහන් විෂයන්වලට සම්මාන සාමාර්ථ සහිතව විෂයයන් 06ක් එක් වරකදී සමත්වී තිබීම.

(i) සිංහල භාෂාව / දෙමළ භාෂාව
(ii) ඉංග්‍රීසි භාෂාව / ඉංග්‍රීසි සාහිත්‍යය
(iii) ගණිතය

සහ

2. අ.පො.ස.(උ/පෙළ) විභාගය එක් වරකදී සියලු විෂයයන් සමත් වීම. (සාමාන්‍ය පොදු පරීක්ෂණ ප්‍රශ්න පත්‍රය හැර)

**පහත සඳහන් සුදුසුකම් සපුරා ඇති අය කෙරෙහි ප්‍රමුඛතාවයක් දක්වනු ලැබේ.**

(a) පිළිගත් ආයතනයකින් ලබා ගත් මාස 06 කට නොඅඩු පරිගණක යෙදුම් භාවිතය පිළිබඳ පිළිගත හැකි සුදුසුකමක් තිබීම.

සහ

(b) පරිගණක යෙදුම් පැකේජ භාවිතය පිළිබඳ වසර දෙකක (02) ක පළපුරුද්දක් තිබීම.

<u>තනතුරට විශේෂ වූ සුදුසුකම්</u>

(a) නිපුණතා සංවර්ධනය හා වෘත්තීය පුහුණු අමාත්‍යාංශය යටතේ ඇති කාර්මික විද්‍යාලයකින් හෝ තාක්ෂණික විද්‍යාලයකින් ලබාගත් ගණකාධිකරණ ශිල්පය පිළිබඳ ජාතික සහතික පත්‍රය හෝ පිළිගත් ආයතනයකින් පිරිනමනු ලබන ඒ හා සමාන සුදුසුකමක් තිබීම.

හෝ

(b) අ.පො.ස.(උ.පෙළ) විභාගය වාණිජ්‍ය විෂය ධාරාවෙන් සමත්වීම.

වැටුප් පරිමාණය : **UMN 1 (III) - රු. 49,475 – 17x540 – 58,655 (මාසික)**

(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** ලිඛිත පරීක්ෂණයක් (ලකුණු 75%) සහ සම්මුඛ පරීක්ෂණයක් (ලකුණු 25%) මඟින් ලිඛිත පරීක්ෂණ විභාගය පහත විෂයන්ගෙන් සමන්විතය

- Knowledge in Sinhala/ Tamil & English Language
- Intelligent quotient and General knowledge
- Computer Literacy
- Relevant Subject area

**7. <u>ආරක්ෂක පරීක්ෂක II ශ්‍රේණිය</u>**

**අවශ්‍ය සුදුසුකම් :**

1. a). අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයන් 06 කින් සමත් වීම සහ සිංහල භාෂාව / දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ ගණිතය යන විෂයන් ඇතුලුව සම්මාන සාමාර්ථ 05 ක් තිබිය යුතුවේ.

**හෝ**

b). අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගය තෙවරකට නොවැඩි වාර ගණනකදී සිංහල භාෂාව / දෙමළ භාෂාව හෝ සාහිත්‍යය සහ ගණිතය විෂයන් ඇතුලුව විෂයන් 06 කින් සමත් වීම සහ විශ්වවිද්‍යාල පද්ධතියේ වසර පහක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.

**සහ**

2. පොලිස් හෝ හමුදා සේවයේ හෝ විශ්වවිද්‍යාල පද්ධතියේ ආරක්ෂක සේවයේ හෝ පිළිගත් ආරක්ෂක සේවයක අවම වශයෙන් වසර 5 ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබිය යුතුය.
3. ක්‍රීඩා කටයුතුවල ක්‍රියාකාරීව සහභාගී වී තිබිය යුතුය.
4. උස - අඩි 5 අඟල් 4 නොඅඩු විය යුතුය.
5. පපුව - අඟල් 34 ට නොඅඩු විය යුතුය.
6. අයදුම් කිරීමේ අවසන් දිනයට වයස අවුරුදු 45 ට නොවැඩි විය යුතුය.

**වැටුප් පරිමාණය : UMN 1 (III) - රු. 49,475 – 17x540 – 58,655 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම:** සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**8. <u>රියදුරු (III ශ්‍රේණිය)</u>**

**අවශ්‍ය සුදුසුකම් :**

1. මෝටර් රථ කොමසාරිස් ජෙනරාල් විසින් නිකුත් කරන ලද බර වාහන සඳහා රියදුරු බලපත්‍රයක් තිබීම සහ එම බලපත්‍රය ලබාගැනීමෙන් පසු අවම වශයෙන් වසර (03) රියදුරු පළපුරුද්දක් තිබීම.

සහ

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) හෝ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන එම තනතුරේ වසර 05 සතුටුදායක සේවාවක් ඉටු කර තිබීම.

- සියළුම අයදුම්කරුවන්,
    - (i) ශ්‍රී ලංකික පුරවැසියෙකු විය යුතුය.
    - (ii) තනතුරේ රාජකාරි හොඳින් ඉටුකිරීමට සහ දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීමට ශාරීරිකව හා මානසිකව යෝග්‍ය විය යුතුය.
    - (iii) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතුය.

**වැටුප් පරිමාණය: U-PL 3 (III) රු.48,005 – 16 x 490 – 55,845 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්.

**9. <u>විදුලි කාර්මික/ ජලනල කාර්මික (III ශ්‍රේණිය)</u>**

**අවශ්‍ය සුදුසුකම් :**

1. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) තනතුරක හෝ නුපුහුණු (U-PL1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම.

සහ

ඉහත එක් එක් තනතුරුවල කාර්යයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික/ වෘත්තීය සුදුසුකම් (NVQ) 4 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

2. ප්‍රාථමික මට්ටමේ අර්ධ පුහුණු (U-PL 2) තනතුරක හෝ ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) තනතුරක සේවය කරන වර්තමාන තනතුරේ තහවුරු කර තිබීම හා අදාළ තනතුරට අදාළ ක්ෂේත්‍රයේ අවමය වසර 05 සේවා පලපුරුද්දක් සමඟ ඉහත එක් එක් තනතුරුවල කාර්යයට අදාළ ජාතික වෘත්තීය සුදුසුකම් (NVQ) 2 වන මට්ටමට නොඅඩු ප්‍රවීණතා ලබා ඇති බව වෘත්තීය පරීක්ෂණයකින් සනාථ කර තිබීම.

වැටුප් පරිමාණය : **U-PL 3 (III) රු.48,005 – 16 x 490 – 55,845 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම :** වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

**10. විද්‍යාගාර සහායක (III ශ්‍රේණිය)**

**අවශ්‍ය සුදුසුකම් :**

1. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) සේවකයෙකු නම් දැනට දරණ තනතුරේ ස්ථිර කර තිබීම.

සහ

(i) අ.පො.ස. (සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ විද්‍යාගාර සහායක කාර්යයට අදාළ තෘතීයික හා වෘත්තීය අධ්‍යාපන කොමිෂන් සභාව විසින් පිළිගත් තාක්ෂණික / වෘත්තීය පුහුණු ආයතනයක් විසින් නිකුත් කරන ලද ජාතික වෘත්තිය සුදුසුකමේ NVQ 2 හෝ 3 මට්ටමට නොඅඩු ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

(ii) අ.පො.ස.(සා/පෙළ) විභාගය අවම වශයෙන් සම්මාන සාමාර්ථ (C) දෙකක් සහිතව වාර දෙකකට නොවැඩි වාර ගණනකදී විෂයයන් හයකින් සමත්වී තිබීම සහ අදාල විෂය ක්ෂේත්‍රයේ වසරක (01) කර්මාන්ත නිපුණතා සහිත සේවා පළපුරුද්දක් ලබා තිබීම.

හෝ

2. ප්‍රාථමික මට්ටමේ නුපුහුණු (U-PL 1) සේවකයෙකු නම් දැනට දරණ තනතුරේ ස්ථිර කර තිබිය යුතු අතර, කර්මාන්ත කුසලතා සහිත, අදාල ක්ෂේත්‍රයේ අවම වශයෙන් අවුරුදු පහක (05) සේවා පළපුරුද්දක් තිබිය යුතුය.

**වැටුප් පරිමාණය:** **U-PL 2 (III) රු.44,575 – 16 x 490 – 52,415 (මාසික)**
(කළමනාකරණ සේවා චක්‍රලේඛ 06/2025 සහ කොමිෂන් සභා චක්‍රලේඛ අංක 02/2025(i) අනුව වැටුප් ගෙවනු ලැබේ)

**බඳවා ගැනීම:** වෘත්තීය පරීක්ෂණයක් හා ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක් මඟින්

බී.ජ්.එන්.ක්‍රිෂාන්ත
ලේඛකාධිකාරි
2025.11.12